# නීති සම්පාදන සංක්ෂිප්ත සටහන්:
# තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පත 2015

## 1. 2015 තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පතේ ප්‍රධාන නිර්දේශයන්හී සාරාංශය

| අංකය | සැලකිලිමත් වන කරුණු | නිර්දේශය |
|---|---|---|
| 1 | 40 වන වගන්තිය යටතේ ඇති දූෂණ හෙළි කරන්නන්ට අදාල දුර්වල විධිවිධාන | යහපත් චේතනාවෙන් හෙළිකිරීම් සිදුකරන දූෂණ හෙළි කරන්නන් සුරක්ෂිත කිරීමෙ විධිවිධාන ශක්තිමත් කිරීම. (ඒවා තොරතුරු දැනගැනීමෙ අයිතිය යටතේ සිදුකෙරන නිශ්චිත ඉල්ලීම්වලට අනුරූප නොවේ.)<br><br>මෙම ස්වේච්ඡා හෙලිදරව් කිරීම් පොදු අධිකාරීන්හි කිරීම හෝ කළමණාකරණ අක්‍රමිකතා දූෂණ හෙලිදරව් කිරීම් දෙසට යොමුවිය යුතුය |
| 2 | තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉදිරිපත් කල ඉල්ලීම් ප්‍රමාදවීම දණ්ඩනයට යටත්කර නොතිබීම | අයහපත් චේතනාවෙන් තොතරතුරු සඳහා කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන තොරතුරු නිලධාරීන්ට එරෙහිව දණ්ඩන ක්‍රමයක් හඳුන්වාදීම<br>ඉංදීය තොරතුරු අයිතිය පනත තුල මෙවැනි දණ්ඩන ක්‍රමයක් ඇත |
| 3. | 43 වන වගන්තිය යටතේ රාජ්‍ය ආයතන යන අර්ථ නිරූපණයට ගැනෙන "මහජන සේවා" සපයන ආයතන අන්තර්ගත කිරීම | "මහජන සේවා " යන යෙදුම ඉවත්කර "මහජන කාර්යය" යන යෙදුම භාවිතයේ තබා ගැනීම. |
| 4. | තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉ-පාලනයේ අවශ්‍යතාවන් සහතික කෙරෙන සඳහන ප්‍රමාණවත් නොවීම. පනත් කෙටුම්පතේ දැක්වෙන්නේ අදාල | ස්ථානීය ප්‍රදර්ශනය කිරීමට අමතරව නිල වෙබ් අඩවි මගින් තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, තොරතුරු දැනගැනීමෙ අයිතිය පිලිබඳ කොමිසමට සහ තොරතරු දැනගැනීමෙ අයිතිය |

| | | |
|---|---|---|
| | තොරතුරු රාජ්‍ය ආයතනයන්හී ප්‍රදර්ශනය කිරීමයි. ( 8 (4), 10 සහ,26 (1) වගන්ති) | යටතට ගැනෙන සියලු රාජ්‍ය ආයතනවලට අනිවාර්ය කිරීම. |
| **5** | 5(1) (ඊ)වගන්තියේ විෂයපථයෙන් නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රකාශිත ලෙස අන්තර්ගත කර තිබීම | නීතිඥ-සේවාදායක වරප්‍රසාද යටතේ ප්‍රමාණවත් තරම් ආරක්ෂණයක ලබන බැවින් නීතිපති දෙපාර්තමේන්තුවට අදාලව දක්වා ඇති විශේෂ සඳහන ඉවත් කිරීම |
| **6** | 10 වන වගන්තිය යටතේ රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කල යුතු වාර්තා සම්බන්ධයෙන් ඒකීය වාර්තාකරන චක්‍රයක් නොමැතිවීම<br><br>මෙම වගන්තියේ සඳහන් කර ඇත්තේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කල යුතු බව පමණි | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වාර්තා සෑම වසරකම මාර්තු 31 වනදිනට කොමිසමට ඉදිරිපත් කිරීම අනිවර්ය කිරීම |
| **7** | Under **Section 25(3)**, a citizen can only seek an expedited response to an information request only if it applies to his/her **own** life and liberty | Amend Section 25(3) to ensure that a request for information that is necessary to safeguard the life or liberty of **any person** including a person other than the citizen making the request shall receive a response within forty-eight hours.<br><br>This is to enable families of arrested, disappeared or missing persons to request information from the relevant authorities and receive information without delay. Section 24(5)(c) sets up this possibility, but section 25(3) then narrows its scope by restricting it to information pertaining to the citizen making the request. |

## 2. ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ කාලනුක්‍රමය

1996: තොරතුරු දැනගැනීමේ නිදහස පිලිබඳ පනත් කෙටුම්පත
2000: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනමාලාව
2003: තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පත
2015: 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

### (i) තොරතුරු දැනගැනීමේ නිදහස පිලිබඳ පනත් කෙටුම්පත

ශ්‍රී ලංකා නීති කොමිසම විසින් 1996 දී තොරතුරු දැනගැනීමේ නිදහස පිලිබඳ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී. පනත් කෙටුම්පත සංසරණය කෙරුණු නමුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකෙරිණ.

### (ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යෝජනාමාලාව

1995 සිට 2000 දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා අවස්ථා කිහිපයකදීම වැයම් කරන ලදී. 2000 වසරේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මගින් තොරතුරු දැනගැනීමේ අයිතියට, මූලික අයිතිවාසිකම් යටතේ ව්‍යවස්ථානුකූල රැකවරණය සලසා දෙනු ලැබීය. නමුත් එකී කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකෙරිණ.

### (iii) තොරතරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පත

2002 වසරේදී තොරතුරු දැනගැනීමේ නිදහසට අදාල නීති හඳුන්වාදීම සඳහා ද්විපාර්ශවීය උත්සහයක් දියත් විය. ඒ අනුව කර්තෘ සංසදය වැනි සිවිල් සහ මාධ්‍ය සංවිධාන එම නීති කෙටුම්පත් සකස් කිරීමට රජය සමග කටයුතු කළේය. එම ක්‍රියාවලියේ මල්පල ගන්වමින් 2004 වසරේදී තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද නමුත් එක්සත් ජාතික පක්ෂ රජය ඉන් සුළු කලකට පසු බිඳ වැටීම නිසා පනත පාර්ලිමේන්තුවට ගෙන ඒමට නොහැකි විය.

එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කරු ජයසූරිය මහතා විසින් 2011 වසරේදී පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස 2003 තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට වැයම් කළේය[i]. තමන් විසින් තොරතුරු දැනගැනීමේ නිදහස තහවුරු කෙරෙන නීති ගෙන එන බව පවසමින් ආණ්ඩුව පනත් කෙටුම්පත ඉවත් කර ගැනීම සඳහා ආරම්භයේදී ජයසූරිය මහතා පොලඹවා ගත්තේය. නමුත් එය සිදු නොවුන බැවින් 2011 ජුනි මසදී ඒ මහතා විසින් පනත් කෙටුම්පත යළිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එසේ වුවත් ඊට විරුද්ධව ඡන්ද 97 ක් සහ පක්ෂව ඡන්ද 34 ක් ලැබීමෙන් පනත පරාජයට පත් විය[ii].

### (iv) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

මෑතකදී සම්මත කෙරුණු 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇමතිවරු, රජයේ දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන ඇතුළු රජයේ ආයතන ගණනාවක පවතින තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ පුරවැසියන්ගේ අයිතිය නිශ්චිතව තහවුරු කරන ලදී. එනමුත් 14-ඒ වගන්තිය යටතේ මෙම අයිතිය බලාත්මක කෙරෙන්නේ නීතිය මගින් ඉඩ ලැබෙන පරිදි පමණකි. එම නිසා නිශ්චිතවම තහවුරු කෙරුණු තොරතුරු දැනගැනීමේ අයිතිය සහිත නීති සම්පාදනයෙන් සැලසෙන ව්‍යවස්ථානුකූල රැකවරණයකින් තොරව තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබේ.

## 3. 2015 තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ ව්‍යාපාරය

තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීම මෛත්‍රිපාල සිරිසේන මහතාගේ දින සියයේ වැඩසටහනේ එක් පොරොන්දුවකි[iii]. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ උපදේශක ක්‍රියාවලිය 2015 පෙබරවාරි මසදී ඇරඹිණ. සාකච්ඡාවට බඳුන් කල

කෙටුම්පත වුයේ 2003 තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව සැකසූ පනත් කෙටුම්පතයි ( මුලික පනත් කෙටුම්පතයි).

ඒ සඳහා ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සිවිල් සමාජ ක්‍රියාධරයින් සහ ජනමාධ්‍යවේදීන්ට ( විස්තර විචාරකයින්) ආරාධනා කරන ලදී. ඔවුන්ගේ සැලකිල්ල යොමුවූ ප්‍රධාන කරුණු පහත පරිදි වේ.

## (අ) තොරතරු දැනගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම සඳහා වන පුළුල් ව්‍යතිරේකයන්

තොරතරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මුලික කෙටුම්පතේ තොරතරු දැනගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම සඳහා වන ව්‍යතිරේකයන් පුළුල් රාමුවක් තුල දක්වා ඇත.

උදාහරණ ලෙස:

මුලික කෙටුම්පතේ 5(ඈ) වගන්තියට අනුව තොරතරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම් "කිසියම් අයෙකුගේ ලිඛිත එකඟතාවයකින් තොරව එම පුද්ගලයාගේ යම් වෙළඳ රහස් හෙළිදරවු වන හෝ වාණිජ ලැදියාවන් කෙරෙහි හානි සිදුවන හෝ තොරතරු හෙලිකිරීම" මත ප්‍රතික්ෂේප කල හැකිය.[iv]

විචාරකයින්ගේ තර්කය වන්නේ " වාණිජ ලැදියාවන් " යන පදයේ ඇති අපැහැදිලි ස්වභාවය නිසා ගනුදෙනු ස්වරූපයේ වන අනීතික කටයුත්තක් වුවද ඒ යටතේ වර්ග කල හැකිය බවයි.[v]

## (ආ) දූෂණ හෙළි කරන්නන්ගේ සුරක්ෂිතතාව දූර්වල මට්ටමක පැවතීම

මුලික කෙටුම්පතේ දූෂණ හෙළි කරන්නන්ට අදාලව ඇති වගන්ති රාමු ගත කර ඇති ආකාරයද විචාරකයින්ගේ සැලකිල්ලට යොමු වෙයි.

මුලික කෙටුම්පතේ 38 වගන්තියට අනුව " පනත යටතේ ඉදිරිපත් කෙරෙන ඉල්ලීමක් මත ලබාදෙන හෝ හෙළිකිරීමට අවසරය ඇති ඕනෑම නිල තොරතුරක් " සඳහා ආරක්ෂාව සැලසේ.

විචාරකයින්ගේ තර්කය වන්නේ රාජ්‍ය ආයතනයන්හී වැරදි ක්‍රියා සහ මුල්‍යය අක්‍රමිකතා හෙළිකිරීමට රාජ්‍ය සේවකයින්ට අදාල වගන්තිය තුලින් ධෛර්යයක් ලබාදීමට අසමත් වී ඇති බවයි. එම තර්කයෙන් අවධානය යොමු කෙරෙන්නේ අදාල වගන්තියේ අවශ්‍යතාවයන් සපුරන්නේ නැතිවීම යන බිය මත යහපත් චේතනාවෙන් තොරතරු හුවමාරු කරගැනීම සඳහා රජයේ සේවකයින්ට මින් අනුබලයක් නොලැබෙන බවයි.

## (ඇ) රහස්‍යතාව පිලිබඳ වගන්තිය

"පනත යටතේ කෙරෙන ඉල්ලීමක ප්‍රතිපලයක් ලෙස ඕනෑම තොරතුරක් සඳහා ප්‍රවේශ වීමට ලබාදෙන අවසරය රාජ්‍යය බලාධිකාරය මගින් එම තොරතරු පළකිරීම සඳහා දෙන ලද අනුමැතියක් හෝ අවසරයක් හෝ ලෙස සැලකිය නොහැකිය..." යනුවෙන් මුලික කෙටුම්පතේ 31 වන වගන්තියෙන් දැක්වෙයි.

පනත යටතේ ලබාගන්නා තොරතරු භාවිතා කිරීමට සහ මහජනතාවට හෙලිකිරීම වැලක්වීම සඳහා මෙම වගන්තියෙන් ඇති හැකියාව විචාරකයින් ගේ විවේචනයට ලක් වෙයි. උදාහරණයක් ලෙස මෙහිදී තර්ක කෙරෙන්නේ මෙමගින් ජනමාධ්‍යවේදීන්ට තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීමකින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීම වැළක්විය හැකිය යන්නයි. එම නිසා විචාරකයින්ගේ මතය වන්නේ මෙම වගන්තිය මගින් තොරතරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීමේ සමස්ත පරමාර්ථයම නිෂ්ඵල කර ඇති බවයි.

## (ඈ) හෙළිදරවු කිරීම් උනන්දු කරවන නියෝගයන්හී දූර්වලතා

තොරතරු දැනගැනීමේ අයිතියට අදාල නීති තුලින් වාර්ෂිකව අමාත්‍යංශ මගින් හෙලිකෙරන තොරතුරු ප්‍රමාණය උපරිම කල යුතුය යන්න විචාරකයෝ අවධාරණය කරති. ඔවුන් පෙන්වා දෙන්නේ "අමාත්‍යවරුන්ගේ වාර්තා " තුලින් අය වැය ප්‍රතිපාදන වෙන්කිරීම් සහ වියදම් දැක්වීමේ අවශ්‍යතාවය ඉවත්කිරීම නිසා හෙළිදරවු කිරීම් උනන්දු කරවීමට අදාල ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට මෙය අසමත්වී ඇති බවයි[vi].

## (ඊ) අනුකූලතාව සහතික කෙරෙන කාලනියමයන් නොමැතිවීම

මුලික කෙටුම්පතේ 25(1) වගන්තිය යටතේ තොරතුරු නිලධාරීන්ට තොරතුරු සම්බන්ධව ඉදිරිපත් කෙරෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජකාරී දින 14 ක උපරිම කාලසීමාවක් ලබාදී ඇත.

විචාරකයින් පෙන්වාදෙන්නේ දින 14 ක සීමාවෙන් පසු සිදුවන ප්‍රමාදවීම් සමබන්ධයෙන් වන නියමයන් දක්වා නොමැතිකම හේතුවෙන් සිදුවන්නේ ඉදිරිපත් කල ඉල්ලීම් ඉබේම ප්‍රතික්ෂේපවීමට බඳුන් වන බවයි. ඊට අදාල අවශ්‍යතා අන්තර්ගත නොකිරීම හේතුවෙන් දිග්ගැස්සෙන ප්‍රමාදයකදී අතෘප්තියට පත්වන ඉල්ලුම්කරුවන්ට ප්‍රතිකර්මයක් ලෙස යොමුවිය හැකි යාන්ත්‍රණයක් (අභියාචනා අධිකරණයට හෝ තොරතරු කොමසාරිස්වරයාට අභියාචනා කිරීම වැනි) නොමැතිවීම ද නිරීක්ෂණයක් වී තිබේ.

## (උ) විෂයපථය තුලට අන්තර්ගත රාජ්‍ය සේවය

මුලික කෙටුම්පතේ 40 වන වගන්තිය යටතේ රාජ්‍ය ආයතන අර්ථ දැක්වීමට "මහජන සේවා සපයන අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික ආයතන හෝ සංවිධාන" යන්න අන්තර්ගත කර ඇත.

කෙටුම්පතේ විෂයපථයට ගැනෙන ආයතන සම්බන්ධයෙන් වන මෙම අර්ථ දැක්වීම මගින් සැලකිය යුතු ව්‍යාකූලතාවයක් මතු විය හැකි බවට විචාරකයෝ අනතුරු හඟවති. “මහජන සේවය ” යනු කුමක්දැයි නිශ්චිත නීතිමය අර්ථයක් නොමැති වීම මීට හේතුවයි.

### (ඖ) මිල අධික ගාස්තු සමබන්ධයෙන් ප්‍රතිකර්මයක් නොමැති වීම

මුලික කෙටුම්පතේ 25(2) වගන්තිය මගින් තොරතුරු නිලධාරීන්ට “ගාස්තු පිළිබඳව විස්තර දැක්වීමක් සහිතව අතිරේක ගාස්තු අයකර ගැනීමට ඉල්ලා සිටිය හැකි බවට ” බලය පවරා තිබේ. විචාරකයන් පෙන්වාදෙන්නේ මෙම බලය පවරා දීම සිදුකර ඇත්තේ අසාධාරණ සහ මිල අධික අයකිරීම්වලට එරෙහිව අභියාචනා කිරීමට අවස්ථාව ලබාදීමෙන් තොරව බවයි.

## 4. 2015, තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත

### මුලික කෙටුම්පතට එකතුකළ වැඩිදියුණු කිරීම්

### (අ) සීමිත ව්‍යතිරේකයන්

2015 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත මගින් තොරතරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට ඇති විෂයපථය පටු කර ඇත. උදාහරණයකට නව 5(ඇ) වගන්තිය මගින් සඳහන් කරන්නේ තොරතුරු ලබාගැනීමට කෙරෙන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළහැක්කේ “තුන්වන පාර්ශ්වයක තරගකාරී තත්වයකට සිදුවිය හැකි අගතියක” දී බවයි. මෙහි භාවිතාවන භාෂාව මීට පෙර සඳහන් කළ “ වාණිජ ලැදියාවන් ” නැමති පුළුල් ව්‍යතිරේකයෙන් බැහැර වෙයි. එබැවින් සම්පුර්ණයෙන් ගනුදෙනු ස්වරූපයේ ක්‍රියා ලෙස සලකා තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට තිබු ඉඩකඩ මෙමගින් වැළකී යයි.

### (ආ) රහස්‍යතාවට අදාල වගන්ති අහෝසි කිරීම

මුලික කෙටුම්පතේ දැක්වුණු රහස්‍යතාවට අදාල වගන්ති 2015 තොරතුරු දැනගනිමේ පනත් කෙටුම්පතින් ඉවත් කර තිබේ. මේ නිසා අපරාධ දණ්ඩනයෙන් තොරව, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ලබාගත් තොරතුරු මහජනතාවට දැන්වීමට ජනමාධ්‍යවේදීන්ට සහ අනෙකුත් කොටස්කරුවන්ට හිමිකම ලැබේ.

### ( ඇ) හෙළිදරවු කිරීම් උනන්දු කරවන ශක්තිමත් වගන්ති

2015 තොරතරු දැනගැනීමේ පනත් කෙටුම්පතේ 8(1)[vii] වගන්තිය යටතේ “සැලසුම් විස්තර, යෝජිත වියදම් සහ සිදුකල වියදම් සහිතව වෙන් කරන ලද අයවැය” අමාත්‍යවරයාගේ වාර්තාවේ විෂයපථයට ඇතුලත් කර තිබේ. හෙළිදරවු කිරීම් උනන්දු

කරවීම සම්බන්ධයෙන් සලකන කළ මෙසේ එක් කළ වගන්ති අමාත්‍යංශයන්හී මූලාා වාර්තාකරණය සහ වගවීම ශක්තිමත් කරයි.

### (ඈ) කාලනියමයන් සහිත බව

2015 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පතේ 25(5) වගන්තිය මගින් රාජ්‍ය ආයතන තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම සඳහා වන කාලය දින 21 කට වඩා දීර්ඝ නොකළ යුතු බව දක්වා ඇත. මීට අමතරව 31 (1) ( ඇ) වගන්තිය මගින් කිසියම් රාජ්‍ය ආයතනයක් මෙම දින 21 සීමාවට අනුකූල නොවන අවස්ථාවක දී ඊට එරෙහිව අභියාචනා කිරීමේ හිමිකම පුද්ගලයාට ලබාදෙයි. සමස්තයක් ලෙස මෙය තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම්වලට අදාල අසාධාරණ ප්‍රමාදවීම් සම්බන්ධයෙන් පියවර ගැනීමට පුද්ගලයෙකුට ඇති හැකියාව පුළුල් කිරීමකි.

### (ඉ) අධික ගාස්තු සම්බන්ධයෙන් වන අභියාචනා

31(1) (ඉ) වගන්තිය මගින් අසාධාරණ ගාස්තු හේතුවෙන් අතෘප්තියට පත්වන අයෙකුට තොරතුරු නිලධාරියාගේ තීරණයට එරෙහිව අභියාචනා කිරීමට ඉඩ සලසයි. මීට අමතරව 14 (ඉ) වගන්තිය මගින් ‘‘හෙළිදරවු කිරීම් උනන්දු කරවීමේ ප්‍රතිපත්තිය මත පිහිටන ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් ’’ නිර්දේශ කිරීමේ වගකීම තොරතුරු අයිතිය පිළිබඳ කොමිසමට පවරා තිබේ. සමස්තයක් ලෙස මෙම අමතර පියවර මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම් සඳහා අසාධාරණ සහ මිල අධික ගාස්තු අය කිරීම් වලක්වයි.

### (ඊ) දත්ත කළමනාකරණයේ තොරතුරු කොමිසමේ භූමිකාව ශක්තිමත් කිරීම

14(උ) වගන්තිය මගින් තොරතුරු අයිතිය පිළිබඳ කොමිසම ‘‘රාජ්‍ය ආයතන විසින් විධිමත් වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිර්දේශ කළ යුතු යැයි’’ සඳහන් කරයි. මෙම අතිරේක කාර්යභාරය මගින් එකමිතික ආකාරයකට දත්ත තෝරා බේරා ගෙන එකතුකර පවත්වාගැනීම සම්බන්ධයෙන් කොමිසමට විශාල භූමිකාවක් පැවරෙයි. මේ නිසා මෙම අමතර පියවර මගින් රාජ්‍ය ආයතන විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉදිරිපත්වන ඉල්ලීම් සම්බන්ධයෙන් දක්වන කර්යසාධනීය අනුකූලතාව ඉහල යනු ඇත.

### (උ) ස්ථාපිත ව්‍යවස්ථාදායක අධීක්ෂණය

මූලික කෙටුම්පතේ 35(1) වගන්තිය මගින් කොමිසම විසින් අඩුම තරමින් වසරකට වරක්වත් එහි ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් සබාගත කළ යුතු බව දක්වයි. එකී

වාර්තාව ජනාධිපතිවරයාට යැවිය යුතු අතර එය පාර්ලිමේන්තුවට යොමු කිරීම ඔහුගේ යුතුකම වෙයි.

එසේනමුත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනත් කෙටුම්පතේ 37(1) වගන්තිය මගින් කොමිසමට ස්වකීය වාර්තා කෙලින්ම පාර්ලිමේතුවේ සබාගත කිරීමට බලය පවරා තිබේ. මෙකී සංශෝධනය මගින් ව්‍යවස්ථාදායක අධීක්ෂණය ඉහල නංවන බව පෙනී යන අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ කොමිසමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන මහජන අවබෝධයද වර්ධනය වෙයි.

## 2015 තොරතුරු දෙනගැනීමේ පනත් කෙටුම්පත සඳහා නිර්දේශ

### (අ) දූෂණ හෙලිකරන්නන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම

දූෂණ හෙලිකරන්නන්ට අදාලව මුලික කෙටුම්පතේ[viii] දක්වා ඇති වගන්ති 2015 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පතේදී ද වෙනසක් වී නොමැත. දූෂණ හෙලිකරන්නන්ට අදාල මෙම දුර්වල විධිවිධාන නිසා රාජ්‍ය සේවකයන් ස්වකීය ආයතනවල දූෂණ, ප්‍රමාණවත් නොවන පහසුකම් සහ මුල්‍ය අවපාලනය පිළිබඳව යහපත් චේතනාවෙන්, ස්වේච්ඡාවෙන් සිදුකරන හෙළිකිරීම් නොකරසිටීමේ තත්වයක් ඇතිවිය හැකිය. මේ පසුබිම යටතේ 2015 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත මගින් දූෂණ හෙලිකරන්නන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍යය. (ආදර්ශ විධිවිධාන සඳහා පහත බලන්න)

(ආ) තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලදී නිලධාරීන් දක්වන අනුකූලතාව ප්‍රමාද වන විට ඒ සම්බන්ධයෙන් අදාල නිලධාරියා පෞද්ගලිකව වගකිව යුතු බව 2105 තෙරතුරුරු දැනගැනීමේ පනත් කෙටුම්පත යටතේ දැනට සඳහන් නොවේ. මෙම ප්‍රමාද දෝෂය තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලට කලට වේලාවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිලධාරීන්ට අනුබලයක් ලබාදෙන බවක් නොපෙනේ . එමෙන්ම වත්මන් පනත් කෙටුම්පත,තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම් නිලධාරීන් විසින් අයහපත් චේතනාවෙන් අසාධාරණ ලෙස ප්‍රමාද කිරීම ප්‍රමාණවත් තරමට වැලැක්වීමට සමත්වන්නක්ද නොවේ.

එම නිසා අනුකූලතාවක් නොදක්වන තොරතුරු නිලධාරීන්ට එරෙහිව දඩුවම් හඳුන්වාදීමට හැකිවන අයුරින් 2105 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත ඉංදියාවේ තොරතුරු දැනගැනීමේ පනත නිදසුනක් ලෙස ගනිමින් සංශෝධනය විය යුතුය. (ආදර්ශ විධිවිධාන සඳහා පහත බලන්න)

### (ඇ) "මහජන සේවා" යන්න "රාජ්‍ය ආයතනයන්ගෙන් " ඉවත් කිරීම

43 (උ) වගන්තිය මගින් රාජ්‍ය ආයතන "මහජන සේවා හෝ මහජන කාර්යය ඉටුකරන අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික ආයතන හෝ සංවිධාන" ලෙස දක්වා ඇත. "මහජන සේවා" යන්න පිලිබඳ නිශ්චිත නීතිමය අර්ථයක් නොමැති නිසා එය අදාල වගන්තියෙන් ඉවත් කල යුතු බවට නිර්දේශ කෙරේ.

එනමුත් "මහජන කාර්යය" යන වදන භාවිතා කරන්නේ නම් ඊට නීතිමය අර්ථකතනයක් ඇති අතර එය සාමාන්‍යයෙන් රාජ්‍යය විසින් සිදුකල යුතු කාර්යයන් ඉටු කරන සෑම ආයතනයකටම අදාලව යෙදිය හැකි වෙයි. එබැවින් "මහජන කාර්යය" යන තනි යෙදුම පමණක් මෙහි විෂය පථය අර්ථදැක්වීම සඳහා යොදාගැනීම ප්‍රමාණවත්ය.

### (ඈ) තොරතුරු දැනගැනීමේ අයිතියට අදාලව ඉ-පාලනය ශක්තිමත් කිරීම

2015 තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පතේ විෂය පථයට ඉ-පාලනය ශක්තිමත් කිරීමට අදාල විධිවිධාන ඇතුලත්ය. ඒ නිසා හෙළිදරව් කිරීම උනන්දු කරවන සහ තොරතුරු ප්‍රදර්ශනයට අදාල වගන්ති තුලට අත්‍යවශ්‍ය තොරතුරු රාජ්‍ය ආයතනවල වෙබ් අඩවි මගින් ද ප්‍රකාශයට පත් කල යුතු යැයි (ආයතන පරිශ්‍රයන් තුල සිදුකරන ප්‍රදර්ශනයට අමතරව) සවිස්තරව සඳහන් කලයුතුය. තොරතුරු දැනගැනීමේ අයිතියට මහජනතාව ප්‍රවේශවීම සහ භාවිතා කිරීම ශක්තිමත් කිරීමට ඉ-පාලනයට හැකියාවක් තිබීම මෙහිදී සැලකිල්ලට ගෙන තිබේ. (ආදර්ශ විධිවිධාන සඳහා පහත බලන්න)

**(ඉ) Allow Any Person to Receive an Expedited Response to Requests Concerning the Life and Liberty of A Person**

The Right to Information Bill 2015 displays an inconsistency between sections 24(5)(c) and 25(3). Section 24(5)(c) permits an expedited response where the citizen making the request believes that the information is necessary to **safeguard the life or liberty of a person**. However, Section 25(3) stipulates an expedited response only if the request for information concerns the life and personal liberty of **the citizen making such request**.

Section 25(3) should be amended to ensure that a request for information that is necessary to safeguard the life or liberty of **any person** including a person other than the citizen making the request shall receive a response within forty-eight hours.

This is to enable families of arrested, disappeared or missing persons to request information from the relevant authorities and receive information without delay.

## 5. 2015 තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත් කෙටුම්පතට යෝජිත සංශෝධන

### (අ) දූෂණ හෙළිකරන්නන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම

රාජ්‍ය ආයතනයක සේවකයෙකු විසින් තොරතුරු නිකුත් කිරීම හෝ හෙළිකිරීම

**40.** (1) ප්‍රමාණවත් තරම් සත්‍යය යැයි හැඟෙන සාධාරණ විශ්වාසයෙන් යුතුව සහ සද්භාවයෙන් ක්‍රියාකරන තාක් දක්වා, සෞඛ්‍යට, ආරක්ෂාවට හෝ පරිසරයට වන බලවත් තර්ජනයක් හෝ වැරදි ක්‍රියාවක් පිලිබඳ සාක්ෂි ඉදිරිපත් කරන කිසිවෙකු හෝ වැරදි ක්‍රියාවක් පිලිබඳ තොරතුරු නිකුත් කිරීම හෝ සෞඛ්‍යට, ආරක්ෂාවට හෝ පරිසරයට බලවත් තර්ජනයක් හෙළි කිරීම හෝ මත එසේ කල අයෙකුට එරෙහිව, නීතිය හෝ වෘත්තීයමය බැඳීම් කඩ කලද, එම තැනැත්තා කිසිදු නීතිමය, පරිපාලනමය හෝ වෘත්තීය දණ්ඩනයකට, යටත් නොකළ යුත්තේය.

(2) පළමුවෙනි (1)උප වගන්තියේ අභිමතාර්ථය සඳහා, වැරදි ක්‍රියාවක් යන්නට අපරාධ වරදක යෙදවීම ,නීතිමය බැඳීමකට අදාලව ක්‍රියා නොකිරීම, යුක්තිය ඉටුවීමේ අවගමනය, දූෂණය හෝ වංචාව, හෝ රාජ්‍ය ආයතනයක බරපතල නොමනා පාලනය යන්න අදාල වේ.

## (ආ) තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කෙරෙන ඉල්ලීම් ප්‍රමාද කිරීම්වලට එරෙහිව දඩුවම් ක්‍රමයක් හඳුන්වා දීම

වැරදි ක්‍රියා

**39.** තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ කොමිසම විසින් අභියාචනය කිරී සඳහා සුදුසු යැයි පැමිණිල්ලක් පිළිබඳව තීරණය කරන අවස්ථාවක දී තොරතුරු නිලධාරියා විසින් සාධාරණ හේතුවකින් තොරව තොරතුරු ලබාගැනීම සඳහා කර ලැබූ ඉල්ලීමක් බාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ (වගන්තිය) යටතේ දක්වා ඇති කාල රාමුව තුල අදාල තොරතුරු සැපයීමට අපොහොසත්වීම හෝ අසද්භාවයෙ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හෝ දැනුවත්වම වැරදි, අසම්පූර්ණ සහ නොමග යවන සුලු තොරතුරු ලබාදීම හෝ ඉල්ලීමට අදාල තොරතුරු විනාශ කිරීම හෝ තොරතුරු සැපයීමේ ක්‍රියාවට කුමනාකාරයෙන් හෝ බාධා සිදු කරනු ලැබ ඇතැයි කල්පනා කරනු ලබන අවස්ථාවකදී, අයදුම්පත්‍රය ලැබෙන තෙක් හෙ තොරතුරු සැපයීම සිදුකරන තෙක් සෑම දිනයක් සඳහාම රුපියල් පන්සියය බැගින් වූ දඩයක් පනවනු ලබන නමුත් එසේ පනවනු ලබන සමස්ත දඩ මුදල රුපියල් පනස් දහස නොඉක්මවිය යුත්තේය.

## (ඇ) "මහජන සේවා" යන්න "රාජ්‍ය ආයතනවලින් " ඉවත් කිරීම

අර්ථ නිරූපනය

**43.** සන්දර්භය මගින් වෙනත් අදහසක් දැක්වීමේ අවශ්‍යතාවකදී හැර මෙම පනතේදී "පොදු අධිකාරිය" යනුවෙන් අදහස් කෙරෙන්නේ -

(උ) කොන්ත්‍රතුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ රජයෙන් හෝ රාජ්‍ය ආයතනයකින් හෝ පළාත්පාලන ආයතනයකින් නිකුත් කල බලපත්‍රයක් යටතේ, ව්‍යවස්ථාපිත හෝ මහජන කාර්යයක් ඉටු කරන පුද්ගලික ආයතනයක හෝ සංවිධානයක, එමගින් ඉටුකරන ව්‍යවස්ථාපිත හෝ මහජන කාර්යයේ ප්‍රමාණය දක්වා පමණකි.

## (ඈ) තොරතුරු දැනගැනීමේ අයිතියට අදාලව ඉ-පාලනය ශක්තිමත් කිරීම

අමාත්‍යවරුන් විසින් වාර්තාවක්

8.(4) උප වගන්ති (1), (2) සහ (3) සඳහන් වාර්තාවන්

පල කිරීම

(අ) නිල භාෂාවෙන් පලකර **සහ** ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලබාගැනීමට

(ආ) කොමිසම මගින් තීරණය කරන ගාස්තුවක් යටතේ මහජන සුපරීක්ෂණය සඳහා ඕනෑම අයෙකුට ලබාගැනීමට

හැකිවිය යුත්තේය.

මහජන ආයතනය තොරතරු නිලධාරීන් ගේ විස්තර සහ අයකරන ගාස්තු ප්‍රදර්ශනය

**26.(1)** සෑම මහජන ආයතනයක්ම සිය නිල පරිශ්‍රය තුල කැපී පෙනෙන අන්දමින් **සහ එහි නිල වෙබ් අඩවියේ**

(අ) කොමිසමේ සහ එහි සාමාජිකයින් සම්බන්ධ කරගත හැකි විස්තර
(ආ) තොරතරු නිලධාරියා සම්බන්ධ කරගත හැකි විස්තර
(ඇ) නමනියම කරන ලද නිලධාරියා සම්බන්ධ කරගත හැකි විස්තර
(ඈ) එම මහජන ආයතනයෙන් තොරතුරු ලබා ගැනීමට අය කරන ගාස්තු

යනාදිය සවිස්තරාත්මකව දක්වා තිබිය යුත්තේය.

පොදු අධිකාරී මගින් වාර්තාවක් නිකුත් කිරීම

**10.** පහත සඳහන් ආකාරයේ විස්තර ඇතුලත් වාර්ෂික වාර්තාවක් සෑම මහජන ආයතනයක් විසින්ම කොමිසමට යොමු කල යුතු අතර එම වාර්තාව අදාල ආයතනයෙන් **සහ එහි නිල වෙබ් අඩවියෙන්** මහජනතාවට ලබාගත හැකිවිය යුත්තේය.

(අ) වසර තුල ලැබුණු සමස්ත ඉල්ලීම් ප්‍රමාණය සහ තොරතුරු සැපයීම සහ ප්‍රතික්ෂේප කල ගණන
(ආ) වසර තුල අය කරගත් මුළු ගාස්තුවල ප්‍රමාණය
(ඇ) 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කල ඉල්ලීම් ගණන
(ඈ) කොමිසමේ නියමය මත තොරතුරු ලබාදුන් වාර ගණන; සහ
(ඉ) පාරදෘශ්‍යභාවයේ කාර්යසාධනය ඉහල නැංවීම පිණිස වන ඕනෑම යෝජනාවක්

## (ඉ) Allow Any Person to Receive an Expedited Response to Requests Concerning the Life and Liberty of A Person

| | |
|---|---|
| Decision on requests submitted under section 24 | **25(3)** A request for information that is necessar safeguard the life or liberty of **any person** incluc a person other than the citizen making the reque shall receive a response within forty-eight hours |

[i] Dileesha Abeysundara, 'Right to Information Act', *The Sunday Leader*, May 27 2015 at http://www.thesundayleader.lk/2012/05/27/right-to-information-act/ (accessed on 20 October 2015).
[ii] *Ibid.*
[iii] Maithrimeter, Scoring 100 days out of a 100, at http://www.manthri.lk/en/maithrimeter (accessed on 20 October 2015).
[iv] Verite Research, Observations on the Draft Right to Information Bill [February 2015].
[v] *Ibid.*
[vi] Section 8, Original Draft RTI Bill; Verite Research, *op. cit.*
[vii] Section 8(1)(v) Right to Information Bill, 2015.
[viii] section 41, Right to Information Bill, 2015.